# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2016

## Primary Piriven Mid -Year Term Test - 2016

### 04 වසර / Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**පාලි** | කාලය : පැය තුන යි

**PALI** | Time : Three Hours

**I** කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට ද **II** කොටසින් **02 හා 06 ප්‍රශ්න** ද ඇතුළත් වන පරිදි ප්‍රශ්න **05කට පමණක්** පිළිතුරු සපයන්න.

---

**I කොටස**

**01.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'වර්ගාන්ත' අකුරු ලියා දක්වන්න.

(ii) 'භූවාදි ගණික' ධාතු **හතරක්** ලියා දක්වන්න.

(iii) අභ්‍යන්තර සන්ධියට නිදසුන් **හතරක්** ලියා දක්වන්න.

(iv) 'යවමදනතරළාචාගමා' යන සූත්‍රයෙන් සන්ධි වූ සන්ධි පද **දෙකක්** ලියන්න.

(v) 'අපාදානය' යනු කුමක් දැයි දක්වා, එහි යෙදෙන විභක්තිය නම් කරන්න.

(vi) සමාස ප්‍රභේද **හතරක්** නම් කරන්න.

(vii) ලංකාවේ පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය **දෙකක්** නම් කරන්න.

(viii) 'ජිනචරිතය' රචනා කිරීමට කරුණු රැස්කරගෙන ඇති වෙනත් ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

(ix) 'රසවාහිනියේ' ප්‍රධාන කථා කොටස් **දෙක** කවරේද?

(x) දුරුතු, නවම්, මැදින්, බක් යන මාස හැඳින්වෙන පාලි වචන ලියා දක්වන්න.

*(ලකුණු 4 × 10 = 40 යි)*

The National e-learning Portal for The General Education

**II කොටස**

**02.** (අ) පහත සඳහන් ඡේදය සිංහලයට පරිවර්තනය කරන්න.

"සා සාධූති සම්පටිච්ඡිත්වා තාය සද්ධිං සඛීභාවං කත්වා විස්සාසෙ උප්පන්නෙ එළිකං තථා අවොච. එළිකා ආළි තව සාමිකෙන සබ්බෙ මම ඤාතකා ඛාදිතා. භායාමි න සක්කොමි ගන්තුන්ති ආහ. ආළි මා භායි මතකො කිං කරිස්සතීති."

*(ලකුණු 06 යි)*

(ආ) පහත දැක්වෙන ව්‍යාකරණාංග එක බැගින් ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

i. පූර්ව ක්‍රියා

ii. භවිස්සන්ති ආඛ්‍යාත

iii. ස්වර සන්ධි

iv. අතීත කිතක

*(ලකුණු 1 × 4 = 04 යි)*

(ඇ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. පුරුෂයා බත් අනුභව කරයි.

ii. වඩකයා හිස සිඳියි.

iii. ලෝකයෙහි බුදුරදුන් හා සම අයෙක් නැත.

iv. ඒ මට මෙබඳු අදහසක් පහළවිය.

v. දැරියෝ ගොයමින් ගවයන් වළක්වති.

*(ලකුණු 1 × 5 = 05 යි)*

03. (අ) බාහිර සන්ධි ප්‍රභේද කීයද? ඒවා මොනවාද?

*(ලකුණු 03 යි)*

(ආ) පහත දැක්වෙන සන්ධි පද විසන්ධි කර සන්ධි ප්‍රභේදය දක්වන්න.

i. සල්ලෙඛො ii. ස්වස්ස iii. උදපාදි iv. ඔනද්ධා

v. කිමඤ්ඤං vi ලොකග්ගො vii. තීනිමානි viii. උග්ගොසො

*(ලකුණු 1 × 8 = 08 යි)*

(ඇ) පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කරන්න.

i. එවං + එව ii. අජ්ජ + අග්ගෙ iii. අනු + එති iv. යං + ඉදං

v. තථා + එව vi. සො + භික්ඛු vii. සං + දිට්ඨිකො viii. ආ + ඛාතං *(ලකුණු 1 × 4 = 04 යි)*

04. (අ) නාම විභක්ති ප්‍රත්‍යය මාලාව විභක්ති සහිතව ලියා දක්වන්න.

*(ලකුණු 03 යි)*

(ආ) උකාරන්ත නපුංසකලිංග **'ගුණවන්තු'** ශබ්දය **හෝ** අකාරන්ත නපුංසකලිංග **'මන'** ශබ්දය **හෝ** සියලු විභක්තිවල වරනගන්න. **(වරනැගීම් වගුව අවශ්‍යයි)** *(ලකුණු 09 යි)*

(ඇ) පහත දැක්වෙන සූත්‍ර සඳහා නිදසුන බැගින් ලියන්න.

i. කරණෙ තතියා
ii. සම්පදානෙ චතුත්ථී *(ලකුණු 03 යි)*

05. (අ) ආඛ්‍යාත විභක්ති **හතරක්** ලියා දක්වන්න. *(ලකුණු 04 යි)*

(ආ) ධාතු ගණ **හතරක්** ලියාදක්වන්න. *(ලකුණු 04 යි)*

(ඇ) පඤ්චමී ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය මාලාව ලියා දක්වා **'වන්ද'** ධාතුව **පඤ්චමී** ආඛ්‍යාත විභක්තියේ කර්තෘකාරක පරස්ස පදයේ වරනගන්න. *(ලකුණු 07 යි)*

06. (අ) පහත සඳහන් ඡේදය සිංහලයට පරිවර්තනය කරන්න.

''එවං ච පන වත්වා දෙවපුත්තො ජම්බුදීපගමනං නිවාරෙත්වා තතො පට්ඨාය ථෙරං දිබ්බමයෙහි චීවරපිණ්ඩපාතසෙනාසනෙහි උපට්ඨහති. තං පඤ්චන්නං භික්ඛුසතානං යාවදත්ථං පහොති.''

*(ලකුණු 03 යි)*

(ආ) පහත සඳහන් ගාථා සිංහලයට පරිවර්තනය කරන්න.

හෙරිනාදසුගන්ධෙන - යාවකාලීසමාගතෙ,
දානකිඤ්ජක්ඛඔසෙනෙ - සත්තාහං පීනයී තතො.

දානග්ගහිමබින්දූනං - නිපාතෙනාපි ධංසනං,
ආයාතං තං විලොකෙත්වා - රතනම්බුජකානනං. *(ලකුණු 2 × 2/1 = 05 යි)*

(ඇ) **ජිනචරිත** කතුවරයා හිමාල වනයෙහි සුන්දරත්වය වර්ණනා කර ඇති ආකාරය නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

**නැතහොත්**

**රසවාහිනියේ** ඔබ දන්නා කථා වස්තුවක් ඇසුරින් ධර්මෝපදේශයක් ලියා දක්වන්න. *(ලකුණු 07 යි)*

07. (අ) **සමාස** යනු කවරේදැ'යි හඳුන්වා ඊට නිදසුන් **දෙකක්** දෙන්න. *(ලකුණු 05 යි)*

(ආ) **සමාසවල** ප්‍රයෝජන 04ක් ලියා දක්වන්න. *(ලකුණු 04 යි)*

(ඇ) **සමාස** ප්‍රභේද 06 ලියා දක්වා උදාහරණය බැගින් ලියන්න. *(ලකුණු 06 යි)*

***